**උ.ප.රා.සේ.කො.ස චක්‍රලේඛ අංක:33/2025**

මගේ අංකය:NP/07/10/01/172
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත
යාපනය
2025.10.07

ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය
පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව
දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව
පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය
උතුරු පළාත

**උතුරු පළාත් රාජ්‍ය සේවයේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ (PL3) රෝහල් සුළු සේවා පාලක තනතුරේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2023 (2025)**

උතුරු පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක NP/04/01/Recruit(HO)/2023 දරණ 2023.04.11 දිනැති ලිපිය, උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අංක G/NPC/AB/H/A/2023/10 දරණ 2023.08.10 දිනැති ලිපියෙන් ලද අනුමැතිය සහ උතුරු පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක NP/04/01/SM/PD/Hos.Ov දරණ 2025.08.05 දිනැති ලිපිය මගින් භාරදුන් ලකුණු ලබාදීමේ පරිපාටිය ඇතුළත් නිර්දේශය යනාදිය ප්‍රකාරව, උතුරු පළාත් රාජ්‍ය සේවයේ **රෝහල් සුළු සේවා පාලක තනතුරේ III වන ශ්‍රේණියේ පවතින පුරප්පාඩු තිස් හතරක් (34)** සඳහා සීමිත පදනම මත බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව මෙම චක්‍රලේඛයෙහි සඳහන් සියලුම සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්හට මේ සඳහා අයදුම් කළ හැකිය. මෙම බඳවාගැනීම සඳහා වන සීමිත තරඟ විභාගය උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් **2025 නොවැම්බර්** මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2025.10.24** වේ.

## 02. බඳවා ගැනීමේ සේවා කොන්දේසි

02.1. 2019.04.08 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2023.02.27 දින අනුමත කරන ලද රෝහල් සුළු සේවා පාලක සේවයේ සේවා ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසි වලට සහ එහි කලින් කලට සිදුකරන ලද සංශෝධනවලට අනුව ද, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1817/30 දරණ 2013.07.03 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා වන කාර්ය පටිපාටික රීති සහ මෙම තනතුරට අදාළව කලින් කලට නිකුත් කරනු ලබන කොන්දේසි, නියමයන් ආදියට යටත්ව තෝරාගන්නා අයදුම්කරුවන් **රෝහල් සුළු සේවා පාලක තනතුරේ III වන ශ්‍රේණියට** බඳවා ගනු ලැබේ.

02.2. ලිඛිත පරීක්ෂණය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මගින් පත්වීමක් සඳහා සුදුසුකම් සම්පූර්ණ කරන අයදුම්කරුවන් පත්වීම් දිනයේ සිට වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව **රෝහල් සුළු සේවා පාලක තනතුරේ III වන ශ්‍රේණියට** පත්කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි. සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි **රෝහල් සුළු සේවා පාලක තනතුරේ III වන ශ්‍රේණියට** බඳවා ගත් දින සිට වසර **තුනක් (03)** ඇතුළත පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතුය.

02.3. පත්වීම් බලධාරියා විසින් නියම කරනු ලබන ආරක්ෂාව පිළිබඳ කාර්ය පටිපාටියකට අනුකූල විය යුතුය.

02.4. මෙම සේවය ස්ථානමාරුවලට යටත්වන සේවයකි. එබැවින් මෙම තනතුරට පත්කරනු ලබන අයදුම්කරුවන් **"උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුය"** යන කොන්දේසියට යටත් විය යුතුය.

02.5. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 සහ මේ සම්බන්ධයෙන් යථා කාලයේ දී නිකුත් කරනු ලබන චක්‍රලේඛවලට අනුව පත්වීමේ දිනයේ සිට **වසර 03 ක්** අවසන් වීමට ප්‍රථම නියම කර ඇති දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

02.6. පත්වීම් සංඛ්‍යාව සහ පත්වීම් ක්‍රියාත්මක වන දිනය යනාදිය පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබයි. කෙසේ වෙතත් නිවේදනය කරනු ලැබූ පුරප්පාඩු අතරින් ඇතැම් පුරප්පාඩු හෝ පුරප්පාඩු සියල්ලම සම්පූර්ණ නොකර සිටීමේ බලය පත්වීම් බලධාරියා සතුය.

## 03. වැටුප් පරිමාණය

අංක 10/2025 දරණ 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව වැටුප් කේතය **PL 3 - 2025** අනුව **රෝහල් සුළු සේවා පාලක තනතුරේ III වන ශ්‍රේණිය** සඳහා ඒකාබද්ධ වැටුප් පරිමාණය **රු.42,780 -10 X 490 - 10 X 540 - 10 X 590 - 12 X 630 - 66,540/=** ක් වේ. (මෙම වැටුප් පරිමාණයේ සිව්වන පියවරට එළඹීමට ප්‍රථම පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය). කෙසේ වෙතත් ඉහත සඳහන් චක්‍රලේඛයේ **III වන උපලේඛනයෙහි** සඳහන් විධිවිධාන පරිදි නියම කරන ලද වැටුප් මෙම තනතුර සඳහා ගෙවනු ලැබේ.

## 04. සාමාන්‍ය සුදුසුකම්

04.1. මෙම බඳවා ගැනීම මෙම තනතුරට අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ/සේවා ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුව සිදුකරනු ලැබේ.

04.2. ආයතන සංග්‍රහයේ විධිවිධාන, රාජ්‍ය සේවය සඳහා වන කාර්ය පටිපාටික රීති යනාදිය මෙම බඳවා ගැනීම සඳහා අදාළ වේ. තවද පළාත් සභාව, ගරු ආණ්ඩුකාරතුමා, ප්‍රධාන ලේකම්, සහ දෙපාර්තමේන්තු විධිවිධාන යටතේ නිකුත් කරන නියමයන් යනාදියට යටත් වේ.

04.3. අයදුම්පත් භාරගන්නා **අවසන් දිනට හෝ ඊට පෙර මෙම තනතුරට අදාළ සියලුම සුදුසුකම්** අයදුම්කරු විසින් සපුරා තිබිය යුතුය.

04.4. **උපරිම වයස් සීමාව** අදාළ නොවේ.

## **05.** අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්

### 05.1 අධ්‍යාපන සුදුසුකම්

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් **දෙවරකට නොවැඩි වාර ගණනක දී** විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් සමත්ව තිබිය යුතුය. මෙයින් විෂයයන් පහක් (05) එක් වරක දී සමත්ව තිබිය යුතුය.

### 05.2 පළපුරුද්ද

උපස්ථායක තනතුරේ I ශ්‍රේණියේ වසර පහක (05) සක්‍රීය හා සතුටුදායක සේවයක් සම්පූර්ණ කර තිබීම හෝ උපස්ථායක තනතුරේ විශේෂ ශ්‍රේණියේ අයෙකු විය යුතු අතර, මෙම තනතුරට අදාළ සේවා ව්‍යවස්ථාවේ නියමයන්ට අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්ව තිබිය යුතුය.

### 05.3 ශාරීරික යෝග්‍යතාවය

සෑම අයදුම්කරු උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක තම තනතුරට අදාළ රාජකාරි ඉටුකිරීමට හැකි යහපත් ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයෙන් හෙබි පුද්ගලයෙකු විය යුතුය.

### 05.4 වෙනත් සුදුසුකම්

I. අයදුම්කරු මනා හැසිරීමකින් යුතු අයෙකු විය යුතුය.

II. අයදුම්පත් භාරගන්නා **අවසන් දිනට මෙම චක්‍රලේඛයේ සඳහන් සියලුම සුදුසුකම්** අයදුම්කරු විසින් සපුරා තිබිය යුතුය.

## **06.** බඳවා ගැනීමේ පරිපාටිය

06.1. ලිඛිත පරීක්ෂණයක් මගින් කුසලතාවය පදනම් කරගෙන බඳවා ගන්නා අවස්ථාවේ දී බලපැවැත්වෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, සේවා ව්‍යවස්ථාව, බඳවා ගැනීමේ පරිපාටිය, ජාතික සහ පළාත් ප්‍රතිපත්ති යනාදිය අනුව **රෝහල් සුළු සේවා පාලක තනතුරේ III** වන **ශ්‍රේණියට** බඳවාගනු ලැබේ. මෙම චක්‍රලේඛය මගින් ඉල්ලා සිටින සුදුසුකම් සියල්ලම සහ ඒවා තහවුරු කෙරෙන ලියකියවිලි ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා වූ හිමිකම් අවලංගු කරනු ලැබේ.

06.2. ලිඛිත පරීක්ෂණයෙන් ප්‍රශ්න පත්‍රය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණයෙන් අවම වශයෙන් **සියයට හතළිහක (40%)** ලකුණු ප්‍රතිශතයක් ලබාගත් අපේක්ෂකයන් සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබයි. කෙසේ වෙතත් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව අපේක්ෂකයන් ලබාගත් වැඩිම මුළු ලකුණු සංඛ්‍යාවේ අනුපිළිවෙළ (Merit Order) අනුව අපේක්ෂකයන් තෝරාගෙන ඔවුන්ගේ තොරතුරු විභාග අංක අනුපිළිවෙළ අනුව පිළියෙල කර ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සඳහා උතුරු පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කරනු ලැබේ. නමුත් අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයෙන් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් වැඩිම මුළු ලකුණු සංඛ්‍යාවේ අනුපිළිවෙල පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා බඳවා ගැනීමේ අවශ්‍යතාවය ලෙස සළකා බලනු ලැබේ.

06.3. ඉහත සඳහන් ආකාරයට බඳවා ගැනීම සඳහා තෝරා ගන්නා අයදුම්කරුවන්ගෙන් විශේෂ අවශ්‍යතා සහිතවූවන් (ආබාධ සහිත පුද්ගලයින්) සඳහා වෙන් වූ ප්‍රතිශතය, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක **27/88** හි විධිවිධාන ප්‍රකාරව සලකා බලනු ලැබේ. අපේක්ෂකයෙකු පත්වීමක් සඳහා තෝරාගැනීමේ දී අදාළ තනතුරේ රාජකාරි ඉටුකිරීමට තම ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වය බාධාවක් නොවන බව විශේෂ වෛද්‍ය පරීක්ෂණයක් මගින් සනාථ කළ යුතුය.

<u>සටහන</u>

**අයදුම්කරු ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන පුනරුත්ථාපන තත්ත්වය යටතේ නියමිත පරිදි අයදුම් කරන බවට අයදුම්පත්‍රයේ සඳහන් කළ යුතු අතර, ආබාධිත පුද්ගලයෙකු නොවන අයදුම්කරුවෙකු තමා ආබාධිත පුද්ගලයෙකු බවට සඳහන් නොකළ යුතුයි.**

## **07.** විභාග ගාස්තු

අයදුම්කරු, විභාග ගාස්තු ලෙස රු.500/= මුදලක් උතුරු පළාතේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකින් **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත"** යන නමට **යාපනය ප්‍රධාන තැපැල් කාර්යාලයෙන්** මාරුකළ හැකි වන පරිදි මුදල් ඇණවුමකින් ගෙවා, අදාළ කුවිතාන්සිය අයදුම්පතෙහි අදාළ කොටුවේ නොගැළවෙන පරිදි අලවා එවිය යුතුය. කුමන හේතුවක් නිසා හෝ මෙම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම ගාස්තුව වෙනත් විභාග සඳහා මාරු කිරීමට ද අනුමත කරනු නොලැබේ.

## **08.** අයදුම්කිරීමේ පිළිවෙල

08.1 මෙම දැන්වීම සමග නිකුත් කරනු ලබන අයදුම්පත www.np.gov.lk උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවිය වෙත පිවිස බාගත කරගෙන, එය සම්පූර්ණ කර **අයදුම්පත් භාරගන්නා අවසාන දින හෝ ඊට පෙර** ලැබෙන පරිදි **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාර දිය යුතුය.

08.2 ඉල්ලුම්පත්‍ර බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"NP/07/10/01/172"** යනුවෙන් සඳහන් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ නිවැරදිව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08.3 අයදුම්කරුවන් තම අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම් කළ යුතුය. ආයතන ප්‍රධානියා විසින් නිර්දේශ නොකරන ලද අයදුම්පත් පිළිගනු නොලැබේ.

08.4 ඉල්ලුම්පත්‍රයේ පිටපතක් තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. ඉල්ලුම්පත්‍රයේ පිටපත් සහ ප්‍රගමන පිටපත් යනාදිය භාරගනු නොලැබේ. විභාගය සඳහා ප්‍රවේශ පත්‍රය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් එවනු ලැබේ. කෙසේ වෙතත්, **විභාග ප්‍රවේශ පත්‍රය එවීමෙන්, අයදුම්කරු සියලු සුදුසුකම් සපුරා ඇති බවට අදහස් නොකෙරේ.**

08.5 අයදුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණු බවට කිසිදු දැනුම්දීමක් කරනු නොලැබේ. තවද අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර, ඉල්ලා ඇති සුදුසුකම් සම්පූර්ණ නොකරන අයදුම්පත් කිසිදු පෙර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැක.

08.6 ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 05 කට වත් පෙර විභාගය ප්‍රවේශ පත්‍රය නොලැබුණේ නම්, ඒ බව පහත සඳහන් විස්තර සහිතව **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට දැන්විය යුතුය. (දුරකතන අංකය - **021-2219939** / ෆැක්ස් අංකය - **021-2219940** / විද්‍යුත් තැපැල - **exampscnp@gmail.com**)

- විභාගයේ නම
- අයදුම්කරුගේ සම්පූර්ණ නම
- ජාතික හැඳුනුම්පත් අංකය
- අයදුම්කරුගේ තැපැල් ලිපිනය
- අයදුම්කරුගේ විද්‍යුත් තැපැල් ලිපිනය
- අයදුම්පතේ පිටපතක්
- අයදුම්පත තැපැල් කළ තැපැල් කාර්යාලය, ලියාපදිංචි තැපෑලේ අංකය සහ දිනය
- විභාග ගාස්තු ගෙවා ඇත්නම් මුදල් ඇණවුමේ සහතික කළ පිටපතක්

## 09. පුද්ගල අනන්‍යතාව තහවුරු කිරීම

09.1 අයදුම්කරුවන් තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමකට පත්විය හැකිවන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් කුමන හෝ ලේඛනවලින් එකක් පිළිගනු ලැබේ.

(i). පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ii). වලංගු ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍රය

(iii). වලංගු රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් ලියකියවිලි අතරින් එකක් හෝ විභාගයට පෙනී සිටීමේ දී ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය **පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ** අභිමතය පරිදි අවලංගු කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන රෙගුලාසිවලට අයදුම්කරුවන් යටත් විය යුතුය. එම රෙගුලාසිවලට පටහැනිව ක්‍රියා කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන දඬුවමකට යටත් විය යුතුය.

09.2 තවද, අයදුම්කරුවන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගත හැකි පරිදි මුහුණ සහ ඉලෙක්ට්‍රෝනික උපාංග පැළඳ නොසිටින බව තහවුරු කරගැනීම සඳහා කන් දෙකම ආවරණය නොකර විභාග ශාලාවට ඇතුළු විය යුතුය. තවද, එසේ තහවුරු කරගැනීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කරනු නොලැබේ. තවද, විභාග ශාලාවට ඇතුළත්වූ මොහොතේ සිට විභාගය අවසන් වී විභාග ශාලාවෙන් පිටත්ව යන තුරු අයදුම්කරුගේ අනන්‍යතාවය තහවුරු වන ආකාරයෙන් මුහුණ සහ කන් දෙක ආවරණය නොකර සිටිය යුතුය.

## 10. අසත්‍ය තොරතුරු සඳහා දඬුවම්

අයදුම්කරු තම ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කිරීමේ දී ඉතා සැළකිලිමත්ව නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය. මෙම විභාගයේ රෙගුලාසිවලට අනුව කිසියම් අයදුම්කරුවෙකු විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන විට හෝ විභාගයෙන් පසුව කුමන හෝ අවස්ථාවක සුදුසුකම් නොමැති අයෙකු බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය එම අවස්ථාවේ දී ම අවලංගු කරනු ලැබේ. අයදුම්කරු ඉදිරිපත් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය බව අනාවරණය වන කුමන හෝ අවස්ථාවක හෝ ඔහු/ඇය පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ඇත.

## 11. අත්සන සහතික කිරීම

**සෑම අයදුම්කරුවෙකුම තමන්ගේ අත්සන සහතික කිරීම අනිවාර්යය වේ.** අයදුම්කරු තම ආයතන ප්‍රධානියා හෝ ආයතන ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු මගින් තම අත්සන සහතික කරවා ගත යුතුය.

## 12. විභාග පරිපාටිය

ලිඛිත පරීක්ෂණය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පහත සඳහන් ආකාරයේ විෂයය අන්තර්ගතය, ලකුණු ලබාදීමේ පරිපාටිය ආදියෙන් සමන්විත වේ.

### 12.1 ලිඛිත පරීක්ෂණය

මෙම ලිඛිත පරීක්ෂණය පහත දැක්වෙන පරිදි ප්‍රශ්න පත්‍රයෙන් සමන්විත වේ. මෙම විභාගය සිංහල සහ දෙමළ යන මාධ්‍ය දෙකෙන්ම පවත්වනු ලැබේ. අයදුම්කරු තමන් විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍ය තෝරාගත යුතු අතර, අයදුම් කරන ලද භාෂාව පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| ප්‍රශ්න පත්‍රය | විෂයය අන්තර්ගතය | කාලය | ලකුණු |
|---|---|---|---|
| උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා වන කාර්ය පටිපාටික රීති සහ ආයතන සංග්‍රහය | පත්වීම්, පරිවාස කාලය, සේවයේ ස්ථිර කිරීම, කාර්යක්ෂමතා කඩඉම, උසස් කිරීම්, නිවාඩු, ජ්‍යෙෂ්ඨතාවය, වැටුප්, වැටුප් වර්ධක, සේවය අවසන් කිරීම, අතිකාල සහ නිවාඩු දින වැටුප්, ගමන් වියදම්, ස්ථානමාරු, නිල ඇඳුම්, හැසිරීම, මූලික විමර්ශනය, චෝදනා පත්‍රය, විනය ක්‍රියාමාර්ග පිළිබඳ කරුණු වලින් සමන්විතය. | පැය 02 යි | 100 |
| විෂයානුබද්ධ දැනුම | රෝහල් සුළු සේවා පාලක තනතුරට අදාළ රාජකාරි හා සම්බන්ධ කරුණු වලින් සමන්විතය. | | |

### 12.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

තරඟ විභාගයෙන් **40%** ක ලකුණු ප්‍රතිශතයක් ලබාගෙන සමත් වූ අපේක්ෂකයන් අතරින් ඉහත 06.2 හි සඳහන් පරිදි සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය, පහත සඳහන් ලකුණු ලබාදීමේ පරිපාටියට අනුව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලැබේ.

| විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|
| **(1) ජ්‍යෙෂ්ඨතාව (Seniority)**<br>**<u>1.1 විශේෂ ශ්‍රේණිය</u>**<br>අ. විශේෂ ශ්‍රේණියේ සම්පූර්ණ කර ඇති සෑම එක් වර්ෂයක් සඳහා<br>ආ. විශේෂ ශ්‍රේණියේ සම්පූර්ණ කර ඇති මාස 06 ට වැඩි මාස (12) ට අඩු සේවා කාලයක් සඳහා<br>**<u>1.2 I ශ්‍රේණියේ වසර පහක (05) සේවා කාලයකට පසු</u>**<br>අ. සෑම එක් වර්ෂයක් සඳහා<br>ආ. මාස 06 ට වැඩි මාස (12) ට අඩු සේවා කාලයක් සඳහා | 10<br>05<br><br>05<br>2.5 | **60** |
| **(2) පළපුරුද්ද, කුසලතා සහ දැනුම (Experience, Skills and Knowledge)**<br>**<u>2.1 පළපුරුද්ද 1</u> -** රෝහල් සුළු සේවා පාලක තනතුරේ වැඩ බැලීම (පත්වීම් බලධාරියා විසින් වැඩ බැලීමේ පත්වීමක් ලබා දී තිබිය යුතුය.)<br>අ. වසරක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සඳහා<br>ආ. මාස හය (06) කට වඩා වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සඳහා<br>**<u>2.2 පළපුරුද්ද 2</u> -** ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය හැර වෙනත් දිස්ත්‍රික්කවල රාජකාරි කර තිබීම.<br>අ. වසරක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සඳහා<br>ආ. මාස හය (06) කට වඩා වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සඳහා<br>**2.3 කුසලතා සහ දැනුම - වාචික පරීක්ෂණය (Viva)**<br>අ. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂා හැකියාව සහ පරිගණක දැනුම | 04<br>02<br><br>02<br>01<br><br>05 | **35** |
| **(3) සම්මුඛ පරීක්ෂණය (Interview Board)**<br>රෝහල් සුළු සේවා පාලක තනතුර හා සම්බන්ධ ආකල්ප (Attitude), පෞරුෂත්වය (Personality) සහ සන්නිවේදන කුසලතා (Communication Skills) | | **05** |
| **එකතුව** | | **100** |

## 13. විභාග ප්‍රතිඵල

විභාග ප්‍රතිඵල උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් www.np.gov.lk උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවියෙහි පළකරනු ලබන අතර, තම තමන්ගේ පුද්ගලික විභාග ප්‍රතිඵල ද www.np.gov.lk ⟶ **Exams & Recruitments** ⟶ **Results** යන සබැඳිය මගින් බලාගැනීමටත්, භාගත කිරීමටත් හැකිය.

**<u>සැළකිය යුතුය</u>**

i. මෙම විභාග දැන්වීමෙහි සඳහන් නොවන මොනයම් හෝ කරුණක් පිළිබඳව උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වේ.

ii. මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීම පිළිබඳ සම්පූර්ණ බලය උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් සතුය.

iii. මෙම කරුණ සම්බන්ධයෙන් කිසියම් පැහැදිළි කරගැනීමක් අවශ්‍ය වන්නේ නම් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශයේ දූරකතන අංක 021-2219939 සමග සම්බන්ධ වන්න.

iv. මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක දෙමළ මාධ්‍ය නිවේදනය බලාත්මක වන බව සැළකිය යුතුය.

v. මෙම චක්‍රලේඛය ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව යටතේ සේවය කරනු ලබන සුදුසුකම් සපුරා ඇති සියලුම නිලධාරීන්ගේ අවධානයට යොමුකරනු මැනවි.

vi. මෙම විභාගය පිළිබඳ නිවේදනය www.np.gov.lk → **Exams & Recruitments** → **Advertisement** → **2025** උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය.

**ආල්වාප්පිල්ලෛ සිරි**
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත
**2025.10.07**